සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.
ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION
ලි.ප. අංකය 7570 නිළ වෙබ් ලිපිනය oisbku.com

අංක 68 ,
දෙහිදෙනිය
පේරාදෙනිය
2020.11.28

# 2020.11.26 දින පැවති සාකච්ඡාවට අදාල කරුණු

2020.11.26 දින අමාත්‍යාංශ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න , සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් බන්දුල තිලකසිරි , අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ෆරීනා ,අමාත්‍යාංශ අධ්‍යක්ෂ සී.ඩී.කලුආරච්චි , අතිරේක ලේකම් අශෝකා අලවත්ත , අතිරේක ලේකම් , නිමල් කොටවලගෙදර , ප්‍රධාන ලිපිකරු උපුල් ජයශාන්ත , ආයතන සමෘද්ධි අධ්‍යක්ෂ එන්.සංජීවනී යන මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී පහත සදහන් ඇතුලත් කර සේවා සංයුතිය හා නව බදවාගැනීම් හා උසස්වීම් පරිපාටිය සකස් කර කළමණාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට තීරණ විය.පහත සදහන් ප්‍රාදේශීය මට්ටමින් කළමණාකරුගේ කාර්යභාරය ඉටු කරණ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සදහා MN – 4 වැටුප් කාණ්ඩයේ තනතුරක් ලබා දීමට යෝජනා වකරණ ලදී.

I. සහකාර කළමණාකරු -බැංකු ,බැංකු සමිති
II. සහකාර කළමණාකරු -ක්ෂේත්‍ර
III. ව්‍යාපෘති සහකාර
IV. සමාජසංවර්ධන සහකාර
V. සෑම බැංකු කලාපයකටම එක් අයෙකු බැගින් ව්‍යාපෘති සහකාර තනතුරක් සදහා (යෝජිත)
VI. සෑම බැංකු කලාපයකටම එක් අයෙකු බැගින් අධීක්ෂණ ප්‍රජාමූල සංවිධාන සහකාර තනතුරක් සදහා (යෝජිත)

එසේම එදින විශේෂ දැනුම් දීම් අතර 2020.11.25 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී සාකච්ඡා කළ කරුණු පිළිබදව දැනුම් දීමක් සිදුකරණු ලැබූහ.

01.නව සේවකයින්ගේ වැටුප පිළිබදව

නව සේවක වැටුප් 2014.01.31 දිනට තමා දරමින් සිටි ශ්‍රේණියේ ආරම්භක වැටුප ලබාදීම සහ ඉදිරියේදී උසස්වීම් ලබාදීමේදී අධිකාරියේ සේවාකාලය සැලකිල්ලට ගැනීම යන කරුණු දෙකට අදාලව වැටුප් කොමිසමේ නව නිර්දේශ සමග රාජ්‍ය පරිපාලන සහ මුදල් යන අමාත්‍යාංශ ඒකාබද්ධව නව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට එකගවී ඇති බව.

02.දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර අන්තර්ග්‍රහනය වී ඇති සියලු නිළධාරීන් හට අධිකාරිය සමයේදී ලබා දී ඇති විනය නියෝග වලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමට 2020.10.05 දින අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අනුමැතිය ලබා දී ඇති බව.